# <u>විනෝද බදු අයදුම් කිරීම සඳහා උපදෙස්</u>

1. විනෝද බදු නිදහස් කරනු ලබන්නේ කොළඹ පළාත් පාලන ප්‍රදේශය තුළ පැවැත්වෙන් ප්‍රසංග සඳහා පමණි.
2. විනෝද බදු නිදහස් කරනු ලබන්නේ සහභාගී වන සියලුම ශිල්පීන් ආධුනික ශිල්පීන් වන්නේ නම් පමණි.
3. විදේශික ශිල්පීන් සහභාගී වන්නේ නම් විනෝද බදු නිදහස් කරනු නොලැබේ.
4. පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුයි.
    - ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සහතිකය
    - සහභාගී වන ශිල්පීන් ආධුනිකයන් බවට සඳහන් කරමින් විනෝද බදු නිදහස් කර ගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.
    - ඉල්ලුම්කරු නිෂ්පාදක නොවේ නම් ඉල්ලුම්කරුගේ නමට සහතිකය නිකුත් කිරීමට නිෂ්පාදක විසින් අවසර ලබා දී ඇති බවට ලිපියක් ඉදිරිපත් කළ යුතුයි.
    - විද්‍යුත් හෝ මුද්‍රිත ප්‍රචාරක දැන්වීම්වල පිටපත් ඉදිරිපත් කළ යුතුයි.
    - අදාළ සංදර්ශනය වෙනුවෙන් නිකුත් කර ඇති මුල් පෙළේ ප්‍රවේශපත්‍ර 02ක් ඉල්ලුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි.
    - අවශ්‍ය වුවහොත් සංදර්ශනයට ඉදිරිපත් කරන අංග ලිඛිතව ඉදිරිපත් කළ යුතුයි.

5. සංදර්ශනය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 10 කට ප්‍රථම අයදුම්පත ඉදිරිපත් කළ යුතුයි.
6. වෙබ් අඩවිය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ඉහත සියලුම ලේඛනවල ඡායාරූප (pdf/jpeg/doc) Google Form හරහා අමුණා එවිය යුතුයි.
7. එසේ අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු සංශෝධන ඇත්නම් වැඩකරන දිනක් ඇතුළත ඒ පිළිබඳ දන්වා ඊමේල්, දුරකථන හෝ WhatsApp මගින් අයදුම්කරුවන් දැනුවත් කරනු ඇත.
8. විනෝද බදු සහතිකපත නිකුත් කිරීමට හැකියාව ඇති අයදුම්කරුවන් දුරකථන මාර්ගයෙන් දැනුවත් කරන අතර සහතිකය ලබා ගැනීම සඳහා ඉහත ඉදිරිපත් කරන ලද ලේඛනවල මුල් පිටපත් (Original) රැගෙන බත්තරමුල්ල සෙත්සිරිපායේ පිහිටි ශ්‍රී ලංකා කලා මණ්ඩලය කාර්යාලය වෙත පැමිණිය යුතුයි.
9. අයදුම්පත ඔබ විසින් සම්පූර්ණ කර රැගෙන ආ යුතු අතර අයදුම්පත අප වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

**සැ.යු. : සහතිකය ලබා ගැනීමට කාර්යාලයට පැමිණීමේදී වෙබ් අඩවිය හරහා ඉදිරිපත් කරන ලද ලේඛනවල මුල්පිටපත් නොවෙනස්ව ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොවන අවස්ථාවක දී එම සහතිකය අවලංගු විය හැකි අතර නැවත සහතිකයක් ඉල්ලුම් කිරීමට සිදුවන බව සලකන්න.**